# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/3 - 2013 ජනවාරි මස 15 වැනි අඟහරුවාදා - 2013.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 25/73.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්දානන්ද අලුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2013 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි II වැනි උපලේඛනයේ විස්තර කර ඇති යම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් වූ ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම ක්‍රීඩා විෂයය පවරා ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු මෙන්ම, එම ඉල්ලීම එකී ජාතික ක්‍රීඩා සංගමයේ සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

3. ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කරනු ලැබිය යුතු යः-

(අ) එම ජාතික ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාවේ පිටපතක් ;

(ආ) එම සංගමයේ ලේකම්වරයා විසින් සහතික කරනු ලැබූ එකී සංගමයේ අවසාන වාර්ෂික මහා සභා රැස්වීම් තුනෙහි වාර්තාවල පිටපත් හෝ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දින සිට වර්ෂ තුනක් ඇතුළත සංගමය පිහිටුවා ඇති අවස්ථාවක දී, පවත්වන ලද සියලුම වාර්ෂික මහා සභා රැස්වීම්වල වාර්තාවල පිටපත් ;

1A - PG 001521 — 700 (2013/01)

(ඈ) අවසාන මහා සභා රැස්වීම් තුනක දී ඉදිරිපත් කරන ලද එකී ජාතික සංගමගේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශවල පිටපත් හෝ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම ඉදිරිපත් කිරීමට පෙර අවුරුදු තුනක් ඇතුළත සංගමය පිහිටුවා ඇති අවස්ථාවක දී පවත්වන ලද වාර්ෂික මහා සභා රැස්වීම් වෙත ඉදිරිපත් කරන ලද සියලු විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශවල පිටපත් ;

(ඇ) එම ජාතික සංගමගේ වර්තමාන නිලධාරී මඬුල්ලේ සහ කමිටු සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් ;

(ඉ) එක් එක් අනුබද්ධිත ආයතනවල සාමාජික සංඛ්‍යාව ද සමග එකී ජාතික සංගමයේ සියලු අනුබද්ධිත ආයතනවල නම් සහ ලිපිනයන් සහ යම් සංගමයක් හෝ සංවිධානයක් ජාතික සංගමයට අනුබද්ධකර ඇත්තා වූ යම් පළාත් සංගමයකට, දිස්ත්‍රික් සංගමයකට, සම්මේලනයකට, ලීගයකට හෝ වෙනත් යම් සංවිධානයකට ඒකාබද්ධ කර ඇති අවස්ථාවක දී, එම පළාත් සංගමයේ, දිස්ත්‍රික් සංගමයේ, සම්මේලනයේ, ලීගයේ හෝ වෙනත් සංවිධානයේ අනුබද්ධිත ආයතනවල සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් සහ සාමාජික සංඛ්‍යාව ; සහ

(ඊ) යම් ජාතික සංගමයක් ලියාපදිංචි කිරීමට පෙරාතුව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍යයැයි සලකනු ලබන යම් අතිරේක තොරතුරු ඉල්ලා සිටිය හැකි ය.

4. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රීඩා අමාත්‍යාංශය සමග ලියාපදිංචි කරනු ලබන ජාතික සංගම්වල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය. රෙජිස්ටරය මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

5. ලියාපදිංචිය සඳහා ඉල්ලා සිටිනු ලබන ජාතික සංගමය පනතේ විධිවිධානවලට එකඟව ක්‍රියාකර ඇති බවට සහ ඒ යටතේ සාදනු ලබන නියෝගවලට එකඟව ක්‍රියා කරනු ලැබ ඇති බවට අමාත්‍යවරයා විසින් සෑහීමට පත්වේ නම්, ලියාපදිංචි ගාස්තුව වන රුපියල් පන් දහසක මුදලක් ප්‍රේෂණය කරන ලෙස ජාතික සංගමය වෙත දැනුම් දෙන ලෙස අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විධාන කරනු ලැබිය යුතු ය.

6. ලියාපදිංචි කිරීමේ ගාස්තු ලැබීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ජාතික සංගමය ලියාපදිංචි කරනු ලැබ මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූල වන්නා වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. කලින් අවලංගු කරනු ලැබුවහොත් හෝ අත්හිටුවනු ලැබුවහොත් මිස එම සහතිකය එහි නිශ්චිතව දක්වා ඇති ජාතික සංගමය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබ ඇති බවට සියලු කාර්ය සඳහා තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

7. එක් එක් ජාතික සංගමයක් අනුබද්ධිත ආයතනවලින් සමන්විත විය යුතු අතර, එම අනුබද්ධිත ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව එකී ජාතික සංගමය විසින් තීරණය කරනු ලැබිය හැකි ලියාපදිංචි සංගම් සහ වෙනත් සංවිධානවල සංයෝගයක් විය හැකිය.

8. සෑම ජාතික සංගමයකම විධායක කමිටුව සඳහා අදාළ පාසැල් සංගම්වලින් අවම වශයෙන් නියෝජිතයන් දෙදෙනෙකුවත් සිටිය යුතු බවට එම ජාතික සංගමයේ ව්‍යවස්ථාවේ විධිවිධානයක් ඇති බවට සහතික විය යුතු ය. අදාළ පාසැල් සංගම්වල ව්‍යවස්ථාව අනුමත කිරීමේ දී ජාතික සංගම්වලින් එහි කමිටු සඳහා නියෝජිතයන් පත්කිරීම සඳහා එකී ව්‍යවස්ථාවේ විධිවිධානයක් ඇති බවට සහතික විය යුතු ය.

9. ජාතික සංගමය සහ පාසැල් සංගම් අතර අන්‍යෝන්‍ය සහයෝගය ඇති කිරීමේ අරමුණින් සියලු පාසැල් සංගම් විසින් අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් වූ ජාතික සංගමයේ රීති සහ නියෝගවලට එකඟව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

10. යම් ජාතික සංගමයක කමිටු රැස්වීම් සෑම මසකට ම වරක්වත් පැවැත්විය යුතු බවට සහ පාසැල් සංගම්වලින් අවම වශයෙන් එක් නියෝජිතයකු එකී රැස්වීම්වලට සහභාගිවිය යුතු බවට සෑම ජාතික සංගමයකම ව්‍යවස්ථාවේ විධිවිධානයක් තිබිය යුතු ය.

11. යම් ජාතික සංගමයක් පිහිටුවා ඇත්තේ යම් නිශ්චිත ක්‍රීඩා හෝ ක්‍රීඩා සමූහයක් සඳහා ද, එම ක්‍රීඩාවල යෙදී සිටින සංගම් සහ වෙනත් සංවිධාන ජාතික සංගමය විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබූ යම් ජාතික සංගමයක් අදාළ ජාත්‍යන්තර පාලක මණ්ඩලය සමග ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

12. (1) යම් ජාතික සංගමයක නිලධාරී මඬුල්ල සහ කමිටු සාමාජිකයන් අවුරුදු දෙකක කාලයක් සංයුක්තවන කාලයක් සඳහා වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කරගනු ලැබිය යුතු ය. සභාපතිවරයා, ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන ධූර සඳහා වූ යම් පුරප්පාඩුවක් විශේෂ මහා සභා රැස්වීමක දී පුරවනු ලැබිය හැකි ය. වෙනත් යම් පුරප්පාඩුවක් වාර්ෂික මහා සභා රැස්වීමක දී අනුමත කර ගැනීමට යටත්ව කමිටු රැස්වීමක දී පුරවනු ලැබිය හැකි ය.

(2) මහා සභා රැස්වීමේ දී තෝරාගනු ලබන නිලධාරී මඬුල්ලට සහ කමිටු සාමාජිකයන්ට අතිරේකව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා ක්‍රීඩා ක්ෂේත්‍රයේ අත්දැකීම් හෝ සුදුසුකම් හෝ හැකියා ඇත්තා වූ තැනැත්තකු අමාත්‍යවරයා විසින් ජාතික සංගමයක කමිටුවට පත් කරනු ලැබිය හැකි ය.

(3) යම් ජාතික සංගමයක් වෙත අනුබද්ධ කර ඇති ක්‍රියාශීලී නොවන යම් ක්‍රීඩා සංගම් නියෝජිතයන් පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. පසුගිය ලිත් වර්ෂය තුළ දී සංගමය විසින් අනුමත කරනු ලැබූ කිසිදු ක්‍රීඩා තරගාවලියක් සඳහා සහභාගී නොවූ යම් ක්‍රීඩා සමාජයක් අක්‍රිය ක්‍රීඩා සමාජයක් ලෙස තීරණය කරනු ලැබේ.

13. (1) එක් වාරයක් සඳහා ජාතික සංගමයක හෝ සම්මේලනයක සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උපසභාපති, සහකාර ලේකම්, සහකාර භාණ්ඩාගාරික යන ධූර දරා ඇති කිසිම තැනැත්තකු ඉහත කිසිම තනතුරක් සඳහා නැවත තේරී පත්වීම සුදුසු නොවන්නේ ය.

එසේ වුව ද, එම නිලධරයන් නැවත තෝරා ගැනීම සඳහා ක්‍රීඩා විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය ලබාගෙන ඇත්නම් ඉහත කී සම්බාධකය අදාළ නොවන්නේ ය.

(2) නැවත තේරී පත්වීම අපේක්ෂා කරනු ලබන නිලධරයාගේ අදාළ ධූරකාලය සැලකිල්ලට ගෙන සහ විශේෂයෙන්ම පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, එනම්-

*(අ)* පළාත්, දිස්ත්‍රික් සහ කලාප මට්ටම්වල ක්‍රීඩා සංවර්ධනයෙහි නියුක්ත වී ඇති ආකාරය පිළිබඳ ව;

*(ආ)* (i) ජාත්‍යන්තර මට්ටමට ක්‍රීඩා ඉහළ නැංවීම ;

(ii) අදාළ ජාතික කණ්ඩායමේ කුසලතා මට්ටම වැඩි කිරීම ;

(iii) දක්ෂතා සහිත ක්‍රීඩකයන් හඳුනාගැනීම ;

(iv) ක්‍රීඩා පරිපාලනයෙහි විනිවිදභාවය සහතික කිරීම,

පිළිබඳ ගන්නා ලද පියවර සැලකිල්ලට ගෙන අනුගාමී තව එක් වරක් සඳහා වූ කාලසීමාවක් සඳහා එකී තැනැත්තන් නැවත පත්කිරීම සඳහා අවසරය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, ඉහත කී තත්ත්වයන්ගෙන් යම් තත්ත්වයක සේවය කරනු ලබන යම් තැනැත්තකුගේ සමස්ත සේවා කාල එකතුව අවුරුදු හතරක් නොඉක්මවිය යුතු ය.

14. යම් තැනැත්තකු අදාළ ක්‍රීඩා සංගමය විසින් ලියාපදිංචි කරන ලද, ප්‍රවර්ධනය කරන ලද, පවත්වන ලද හෝ අනුමත කරන ලද යම් ප්‍රධාන ක්‍රීඩා තරගාවලියක්, ක්‍රීඩා උත්සවයක හෝ තරගයක දී කණ්ඩායම් ඉසව්වක් සඳහා දෙවරකට වැඩි වාර ගණනක් හෝ තනි ඉසව්වක් හෝ ක්‍රීඩාවක් සඳහා එක් වරක් ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත්නම් මිස, යම් ජාතික සංගමයක භාණ්ඩාගාරික හෝ සහකාර භාණ්ඩාගාරික ධූරය හැර එම සංගමයේ නිලධරයකු හෝ කමිටු සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා නම් කරනු නොලැබිය යුතු ය. වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව තෝරා ගැනීම සඳහා නම් කරනු ලැබිය හැකි ය.

15. (1) යම් තැනැත්තකු -

*(අ)* නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු වන බවට විනිශ්චය කරන ලද්දේ නම් හෝ විනිශ්චය කරනු ලැබ ඇත්නම් ;

*(ආ)* නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු ලෙස විනිශ්චය කරන ලද්දේ නම් හෝ විනිශ්චය කරනු ලැබ ඇත්නම් ;

*(ඇ)* යම් වරදකට අධිකරණයක දී වරදකරු කරනු ලැබුවේ නම් හෝ වරදකරු කරනු ලැබ සිටී නම් සහ මාස හයකට නොඅඩු සිර දඬුවමක් ලැබ ඇත්නම් ;

*(ඈ)* යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයෙන් වෘත්තීයමය ජනමාධ්‍යවේදියකු හෝ එවැනි ජාලයක අයිතිකරුවකු වේ නම් ;

(ඉ) එම නිශ්චිත ක්‍රීඩා ජාතික සංචිතයේ හෝ ජාතික කණ්ඩායමේ තරගකරුවකුගේ දෙමාපියකු හෝ සහෝදර - සහෝදරියක වේ නම් ;

(ඊ) යම් කණ්ඩායමක හෝ තනි පුද්ගල තරගකරුවකුගේ වර්තමාන පුහුණුකරු හෝ තීරකවරයකු වන නමුත් එම සංගමයෙන් යෝග්‍ය තරගකරුවකු නොමැති නම් එවැනි තැනැත්තකු අමාත්‍යවරයාගෙන් අවසරය ලබා ගත යුතු ය ;

(උ) ක්‍රීඩා මණ්ඩලයක ක්‍රීඩයෙකු, නියෝජිතයකු හෝ කළමනාකරුවකු වේ නම් ;

(ඌ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් ;

(එ) එම ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, මෙවලම්, අයිතම හෝ උපකරණ නිෂ්පාදනය කිරීමේ, එකලස් කිරීමේ, නිපදවීමේ, විකිණීමේ හෝ බෙදාහැරීමේ ඍජුව හෝ වක්‍රව යෙදී සිටී නම් ;

(ඒ) සූදු ව්‍යාපාරයක ඍජුව හෝ වක්‍රව යෙදී සිටී නම් ;

(ඔ) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවයේ නියුක්තව සිටී නම් ;

(ඕ) කොමිෂන් ලබාදීම අභිමි කරනු ලැබූ යම් සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වේ නම් ;

(ක) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ පනත යටතේ මුදල් විශුද්ධිකරණය යන වරද සඳහා වරදකරු වී සිටී නම් ; හෝ

(ග) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමතය මත ක්‍රීඩා කටයුතු සම්බන්ධයෙන් ලංකාව නියෝජනය කළ පුද්ගලයකු නියමිත කාලයේ දී ලංකාවට නැවත නොපැමිණි තැනැත්තෙක් නම්,

යම් ජාතික සංගමයක වේතනයක් ලබන හෝ වේතනයක් නොලබන ධුරයක් සඳහා තෝරා ගැනීමට හෝ අන්‍යාකාරයකින් ධුර දැරීමට හෝ අඛණ්ඩව ධූරය පවත්වාගෙන යෑමට හෝ යම් ජාතික සංගමයක කමිටු සාමාජිකයකු වශයෙන් ගෙවීම් ලබන හෝ ගෙවීම් නොලබන ධුරයක් දැරීමට හෝ යම් ජාතික සංගමයක අනුබද්ධිත ක්‍රීඩා සමාජයක හෝ සංවිධානයක නාමිකයකු වීම සඳහා ඒ තැනැත්තා නුසුදුස්සකු වන්නේ ය.

(2) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ යම් ගෙවන හෝ නොගෙවන ධූරයක් සඳහා තෝරාගැනීම හෝ අන්‍යාකාරයකින් ධුර දැරීම හෝ පවත්වාගෙන යෑම සඳහා හෝ යම් ජාතික සංගමයක කමිටු සාමාජිකයකු වීම හෝ යම් ජාතික සංගමයක යම් අනුබද්ධිත ක්‍රීඩා සමාජයක හෝ සංවිධානයක නාමිකයකු වීම සඳහා යම් තැනැත්තකු නුසුදුසු බවට නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව අමාත්‍යවරයා විසින් සෑහීමට පත්වේ නම්, අමාත්‍යවරයා විසින් එම තැනැත්තා එකී ධුරයෙන්, තනතුරෙන්, කමිටුවෙන් හෝ ඔහුගේ නාමික තත්ත්වයෙන් ඉවත්කරන ලෙස වහාම විධාන කරනු ලැබිය යුතු ය.

16. යම් ජාතික සංගමයක නිලධාරී මඬුල්ල සහ කමිටු සාමාජිකයන් තෝරාපත්කර ගැනීම සඳහා වූ සියලු නාමයෝජනා ඡන්දය ලබා දීමට සුදුසුකම් ඇති යම් සාමාජික ක්‍රීඩා සමාජයක හෝ සංවිධානයක සභාපති හෝ ලේකම් විසින් යෝජනාකර ඡන්දය දීමට සුදුසුකම් ඇති වෙනත් යම් සාමාජික ක්‍රීඩා සමාජයක හෝ සංවිධානයක සභාපති හෝ ලේකම් විසින් ස්ථිර කරනු ලැබිය යුතු ය. ස්වකීය ජීව දත්ත ද සමග එකී නාමයෝජනා වාර්ෂික මහාසභා රැස්වීම සඳහා නියම කර ඇති දිනයට අවම වශයෙන් දින තිහකටවත් පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබෙන පරිදි අතින් ගෙනවිත් භාරදීම හෝ තැපැල් කිරීම කරනු ලැබිය යුතු ය. ඉන්පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝජිතයකු විසින් එම සංගමයේ විශේෂ කමිටු රැස්වීමක දී එම නාමයෝජනා විවෘත කරනු ලැබිය යුතු ය. ඉල්ලුම්කරුගේ ජීව දත්ත සමග නාමයෝජනා පත්‍රවල පිටපතක් වාර්ෂික මහා සභා රැස්වීම් දිනට අවම වශයෙන් දින තිහකටවත් පෙර අමාත්‍යාංශය වෙත යවනු ලැබිය යුතු ය.

17. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතය ඇතිව ජාතික සංගමය විසින් තීරණය කරනු ලබන ස්ථානයක දී, දිනයක දී සහ වේලාවක දී යම් ජාතික සංගමයක සෑම වාර්ෂික මහා සභා රැස්වීමක්ම පවත්වනු ලැබිය යුතු ය. යම් ජාතික සංගමයක මහා සභා රැස්වීම්වල සහ වාර්ෂික මහා සභා රැස්වීම්වල තෝරාපත් කර ගැනීම් සහ තීරණ රහස්‍ය ඡන්දය මගින් සිදුවිය යුතු අතර ඡන්දය දීම පිළිබඳ විස්තර එම රැස්වීම්වල වාර්තාවල වාර්තා කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝජිතයකු එම අවස්ථාවට පැමිණ සිටිය යුතු ය.

18. එකී සංගමය සඳහා තෝරාගනු ලැබූ නිලධාරී මඬුල්ල සහ කමිටු සාමාජිකයින් පිළිබඳ ජීවදත්ත සෑම ජාතික සංගමයක් විසින්ම එකී සංගමයේ කමිටු සාමාජිකයන් සහ නිලධාරීන් තෝරාපත් කළ දින සිට දින දාහතරක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

19. (1) යම් ක්‍රීඩාවක් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති හෝ වාර තුනකට වැඩි වාර ගණනක් ප්‍රධාන ක්‍රීඩා තරගාවලි, තරග හෝ ක්‍රීඩා උත්සව සඳහා සහභාගී වී ඇති තැනැත්තන්ගෙන් සමන්විත තේරීම්, ශ්‍රේණිගත සහ වර්ගීකරණ කමිටු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර අදාළ ක්‍රීඩාවේ තරගකරුගේ දෙමාපියකු හෝ සහෝදර - සහෝදරියක එම කමිටු සඳහා ඇතුළත් නොවිය යුතු ය. ජාතික සංගමය විසින් එකී කමිටු සඳහා සලකා බැලීමට තැනැත්තන් දස දෙදෙනකුගේ නම් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම පත්කිරීම් කරනු ලැබීම සම්බන්ධයෙන් ජාතික සංගමයේ කමිටුව විසින් නම් කරනු ලබන තැනැත්තන් අමාත්‍යවරයා විසින් සලකා බලනු ලැබිය හැකි ය.

(2) ජාතික තේරීම්කරුවන්ගේ එකඟත්වය ඇතිව ජාතික සංගමය විසින් තේරීම් නිර්ණායක ප්‍රතිපත්තියක් කෙටුම්පත් කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය බවට තීරණය කරනු ලබයි නම් යම් හේතු සහිතව (1) වැනි ඡේදය යටතේ ඔහු විසින් පත් කරන ලද යම් කමිටුවක සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි යි.

(4) යම් සාමාජිකයකු මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ඇතිවන පුරප්පාඩුවක් වෙනුවෙන් පත් කරනු ලබන යම් තැනැත්තකු තමා අනුප්‍රාප්තවන එම සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

20. ජාතික සංගමයක තේරීම්, ශ්‍රේණිගත හෝ වර්ගීකරණ කමිටුවක යම් සාමාජිකයකු හෝ එම ක්‍රීඩාවේ පුහුණුකරුවකු එම ජාතික සංගමයේ තේරීම් කමිටුව විසින් තෝරාගනු ලබන කිසිම කණ්ඩායමක් සඳහා තෝරාපත් කිරීමට සුදුස්සෙකු නොවිය යුතු ය.

එසේ වුව ද (තේරීම්කරුවකු නොවන) යම් කණ්ඩායමක නායකයකු වශයෙන් තෝරාගනු ලබන තැනැත්තා සහ ජාතික පුහුණුකරු එම කණ්ඩායමේ වෙනත් සාමාජිකයන් තෝරාගැනීම සඳහා වූ කමිටුවට අනුයුක්ත කරනු ලැබිය හැකි ය.

21. (1) ශ්‍රී ලංකාවේ හෝ විදේශයෙහි ජාතික කණ්ඩායම සඳහා තෝරාගෙන ඇති ක්‍රීඩකයන්ගේ නම් එම තෝරා ගැනීම සඳහා වූ නිර්ණායක ද ප්‍රකාශයට පත්කරමින් අමාත්‍යවරයා වෙත ජාතික තේරීම් කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ලැබෙන තෙක් එම තෝරාගත් ක්‍රීඩකයන්ගේ නම් හෙළිදරව් නොකළ යුතු ය.

(2) ජාතික නොවන හෝ සංයුතිය වශයෙන් නියෝජනය කරනු නොලබන හෝ ජාතික වශයෙන් සංයෝජනය වී නැති තමාගේම සම්පත් භාවිතයෙන් තමාගේ ශක්‍යතාව අනුව යම් තනි පුද්ගල සහභාගීත්වයක් නොවන්නා වූ යම් ක්‍රීඩා සමාජයක් හෝ වෙනත් කණ්ඩායමක් තේරීම සඳහා මේ නියෝගයේ (1) වැනි ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

22. (1) යම් තැනැත්තකු -

(අ) ක්‍රීඩා සංගමය විසින් ප්‍රවර්ධනය කරන ලද යම් ක්‍රීඩාවක ශ්‍රී ලංකාවේ කණ්ඩායමක්, යම් අනුබද්ධිත ක්‍රීඩා සමාජයක් හෝ සංවිධානයක් නියෝජනය කර ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු වේ නම් ; හෝ

(ආ) එම ක්‍රීඩා සංගමය විසින් ප්‍රවර්ධනය කරන ලද යම් ක්‍රීඩාවක යෙදී සිටින ශ්‍රී ලාංකික ක්‍රීඩා කණ්ඩායමක්, අනුබද්ධිත ක්‍රීඩා සමාජයක් හෝ සංවිධානයක් නියෝජනය කරමින් ශ්‍රී ලංකාව නියෝජනය කළ ශ්‍රී ලාංකික ක්‍රීඩකයෙක් වේ නම් ;

(ඇ) ජාතික සංගමය විසින් ප්‍රවර්ධනය කරන ලද යම් ක්‍රීඩාවක යෙදී සිටින ශ්‍රී ලංකාවේ කණ්ඩායමක් නියෝජනය කර ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තෙකු වේ නම්,

මිස, යම් ජාත්‍යන්තර සංගමයක් සඳහා ශ්‍රී ලංකාවේ අනුයෝජිතයකු හෝ නියෝජිතයකු වශයෙන් කිසිම තැනැත්තකු පත්කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, යම් තැනැත්තකුට ඉහත කී නිර්ණායක කිසිවක් නොමැති අවස්ථාවක දී, එකී සංගමයේ පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්දක් සහිත යම් තැනැත්තකු ජාතික සංගමයේ නිර්දේශය සහිතව අමාත්‍යවරයා විසින් වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා පත් කරනු ලැබිය හැකි ය.

23. සෑම ජාතික සංගමයක් විසින්ම ස්වකීය අනුබද්ධිත ක්‍රීඩා සමාජ සහ වෙනත් සංවිධානවල නියෝජනය කිරීමේ ක්‍රමය සහ ඡන්ද අයිතිය පිළිබඳව ස්වකීය ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

24. අනුබද්ධ කිරීමේ දින සිට අවම වශයෙන් මාස දොළහක්වත් වූ කාලසීමාවක් අවසන්වන තෙක් කිසිම ජාතික සංගමයක් විසින් එහි අනුබද්ධිත ආයතන වෙත ඡන්ද අයිතිය ප්‍රදානය නොකළ යුතු ය.

25. සෑම ජාතික සංගමයකම ව්‍යවස්ථාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් ජාතික සංගමයක් විසින් එම සංගමය වෙත එකී තීරණය ලබාදුන් දින සිට දින තිහක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

26. සෑම ජාතික සංගමයක් විසින්ම සෑම වසරකම මාර්තු මස තිස් එක්වන දින හෝ එදිනට පෙර වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීම සෑම අවුරුදු දෙකකට වරක්ම පවත්වනු ලැබිය යුතු අතර තෝරාගත් නිලධාරීන් අවුරුදු දෙකක කාලයක් සඳහා ධූර දරනු ලැබිය යුතු ය.

27. සෑම ජාතික සංගමයක් විසින්ම පසුගිය මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ වාර්ෂික වාර්තාවක් සහ ගිණුම් ප්‍රකාශයක් ස්වකීය වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

28. සෑම ජාතික සංගමයක් විසින්ම සෑම මුදල් වර්ෂයක්ම අවසන් වී මාස තුනක් ඇතුළත එම මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ වරලත් ගණකාධිකාරීවරයකු විසින් සහතික කරන ලද විගණනය කළ ගිණුම් ප්‍රකාශයක් සහ වාර්ෂික වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

29. සෑම ජාතික සංගමයක් විසින් ම වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වනු ලබන දිනය පිළිබඳව අවම වශයෙන් දින හතළිහකටවත් පෙර ස්වකීය අනුබද්ධිත ආයතන වෙත නිවේදනය කළ යුතු ය. එම නිවේදනය සඳහා වාර්ෂික වාර්තාව සහ එම වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් සහිත සාමාජිකයන්ගේ ලැයිස්තුව අමුණා තිබිය යුතු ය. එම නිවේදනයෙහි එක් එක් අනුබද්ධිත ආයතනය වෙත ක්‍රියාත්මක කිරීමට හිමිකම් ඇති ඡන්ද ප්‍රමාණය ද නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය. එම ඡන්ද අයිතිය ක්‍රියාත්මක කරනු ලබන අනුබද්ධිත ආයතනය විසින් එක් එක් ක්‍රීඩා සමාජය විසින් ලබා දී ඇති විධානය ප්‍රකාරව ක්‍රියාකරනු ලබන බවට සහතික විය යුතු ය. වාර්ෂික මහා සභා රැස්වීමට සති දෙකකටවත් පෙරාතුව සියලු සාමාජිකයන් වෙත නාමිකයන්ගේ ලැයිස්තුවක් ද සමග පසුගිය මුදල් වර්ෂයේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයේ සහතික පිටපතක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

30. (1) පසුගිය වර්ෂයේ දී ජාතික සංගමය විසින් අනුමත කරන ලද සහ පවත්වන ලද යටත් පිරිසෙයින් ක්‍රීඩා තරග දෙකකටවත් සහභාගී වී ඇති සෑම ක්‍රීඩා සමාජයක් ම හෝ අනුබද්ධිත ආයතනයක් ම ජාතික සංගමයක වාර්ෂික මහා සභා රැස්වීමක දී ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම් ලබන්නේ ය.

(2) එවැනි තරගාවලියකට හෝ තරගයකට සහභාගීවී ඇති ක්‍රීඩකයන්ගේ නම් එකී වාර්ෂික මහා සභා රැස්වීමට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම ක්‍රීඩා සමාජයක්ම හෝ අනුබද්ධිත ආයතනයක් ම තමා විසින් වර්ෂය පුරාම ස්වකීය ව්‍යවස්ථාවට එකඟව ක්‍රියාකර ඇති බවට ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු මෙන්ම විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) සෑම ක්‍රීඩා සමාජයක්ම හෝ අනුබද්ධිත ආයතනයක්ම විසින් වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා ජාතික සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම් දිනට යටත් පිරිසෙයින් දරන හැටකටවත් පෙර නිලධාරී මඩුල්ල තෝරා පත් කරනු ලැබිය යුතු ය.

31. ගණපූරණය නොමැතිවීම හේතුවෙන් යම් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීම කල්දමනු ලැබුවහොත්, එම න්‍යාය පත්‍රයම සහිතව රැස්වීම නැවත පැවැත්වීම පිළිබඳව දින දාහතරකට පෙර දැනුම් දෙනු ලැබිය යුතු ය. එසේ නැවත කැඳවන ලද රැස්වීමේ දී ගණපූරණය නොමැති අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලැබිය යුතු ය.

32. සෑම ජාතික සංගමයක් විසින්ම ස්වකීය ධූර කාලය ආරම්භයේ දී විනය කමිටුවක් පත්කරනු ලැබිය යුතු අතර, එම විනය කමිටුවට ක්‍රීඩා විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ඇතුළත් විය යුතු ය.

33. සෑම ජාතික සංගමයක් විසින්ම අදාළ දිස්ත්‍රික්කවල ක්‍රීඩා සමාජවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කර ජාතික සංගමය වෙත වාර්තා කිරීමේ කාර්ය සඳහා වගකියනු ලැබිය යුතු දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධරයන් පත් කරනු ලැබිය යුතු ය.

34. ජාතික සංගමය විසින් නිලධාරී මඩුල්ල තෝරා පත් කිරීමෙන් පසුව මාස දෙකක කාලයක් ඇතුළත ක්‍රීඩා සංවර්ධනය උදෙසා කරනු ලබන වැඩ සටහන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

35. අමාත්‍යාංශයේ ප්‍රදාන ලබාගැනීම අපේක්ෂා කරනු ලබන යම් ජාතික සංගමයක් විසින් වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසුව මාස දෙකක කාලයක් ඇතුළත සංක්ෂිප්ත අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

36. සෑම ජාතික සංගමයක් සඳහා ම ජාතික මට්ටමේ ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, විනිසුරුවරුන් හෝ තරග තීරකවරුන් වශයෙන් ක්‍රීඩාවන්හි ක්‍රියාකාරී ලෙස යෙදී සිටින තැනැත්තන්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් තිබිය යුත්තේ ය. ඔවුන් විසින් ක්‍රීඩාවල

තාක්ෂණික සංවර්ධනය පිළිබඳව ජාතික සංගමය වෙත උපදෙස් ලබාදීම මෙන්ම තරග සංවර්ධනය සැලසුම සහ තරගාවලි ව්‍යුහය අනුමත කිරීම කරනු ලැබිය යුතු ය.

37. සෑම ජාතික ක්‍රීඩා සංගමයක් විසින්ම එක් එක් තනිපුද්ගල ක්‍රීඩකයන් නියෝජනය කරනු ලබන ඔවුන්ගේ නියෝජිතයන්, කළමනාකරුවන් හෝ පුහුණුකරුවන්ගේ රෙජිස්ටරයක් පවත්වාගෙන යෑමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

38. (1) ජාත්‍යන්තර පාලක මණ්ඩලය හෝ යම් සමාන ආයතනයක් වෙතින් ත්‍යාග හෝ ප්‍රදාන හෝ සහාය වශයෙන් විදේශීය ප්‍රදාන හෝ අරමුදල් ලැබෙන අවස්ථාවක දී, පරිත්‍යාග කරනු ලබන නියෝජිත ආයතනය විසින් පනවනු ලබන රීති සහ කොන්දේසිවලට එකඟව ජාතික සංගමය විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර, යම් ගිවිසුමකට එළඹීමට පෙරාතුව අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය. ජාතික සංගමය විසින් ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කරනු ලැබිය යුතු මෙන්ම එම ප්‍රදාන පත්‍රයේ පිටපතක් සහ අරමුදල් ප්‍රයෝජනයට ගනු ලබන ආකාරය ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී සියලු ප්‍රදාන හෝ අරමුදල් මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ලබා ගත යුතු ය.

(2) රජයෙන් අරමුදල් ලැබී ඇත්තා වූ හෝ දේශීය වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් අරමුදල් ලබාගෙන ඇත්තා වූ ටෙන්ඩර්පත් ලබා ගැනීම සහ ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වූ අදාළ රජයේ ටෙන්ඩර් පටිපාටියට සෑම ජාතික සංගමයක්ම යටත් විය යුතු මෙන්ම එම ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ යම් ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් පැවැත්වීම සඳහා ගිවිසුමකට එළඹෙන සෑම ජාතික සංගමයක් විසින්ම, සහභාගිවන රටවල්, අවශ්‍යවන මුදල් ප්‍රමාණයන්, සහභාගිවන්නන් ප්‍රමාණය, දින, ස්ථානයන්, එකී ක්‍රීඩා ඉසව් පැවැත්වීමට අවශ්‍ය හෝ පවතින පහසුකම් සහ යෝජනාවලට අදාල වෙනත් වැදගත් තොරතුරු ඇතුළත් වන සංක්ෂිප්ත යෝජනාවක් ඉදිරිපත් කරමින් අමාත්‍යවරයාගෙන් පූර්ව අනුමැතිය ලබාගත යුතු ය. ශ්‍රී ලංකාව සත්කාරක රට වශයෙන් යෝජනා කිරීමට සැලසුම් කරනු ලබන යම් ජාත්‍යන්තර රැස්වීමකට සහභාගිවීමට පිටත්ව යාමට මාස තුනකට පෙර ජාතික සංගමය විසින් යෝජනාව ඉදිරිපත් කළ යුතු ය.

39. යම් විනය විරෝධී ක්‍රියාවක් හේතුවෙන් සේවය අත්හිටුවා ඇති යම් තැනැත්තකු වෙත එම සේවය අත්හිටුවීමේ දින සිට සතියක කාලයක් ඇතුළත චෝදනා පත්‍රයක් භාරදෙනු ලැබිය යුතු ය. මේ සම්බන්ධයෙන් වූ චෝදනා පත්‍රය භාරදීමේ දින සිට සති හයක කාලයක් ඇතුළත විනය පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල අමාත්‍යවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

40. වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමේ දින සිට දින දාහතරක කාලයක් ඇතුළත එම වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාවේ පිටපතක් සෑම ජාතික සංගමයක් විසින්ම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

41. සෑම ජාතික සංගමයක් විසින්ම දේශීය සහ විදේශීය ප්‍රභවයන්ගෙන් සංගමය වෙත ලැබුණු සියලු මුදල්, උපකරණ සහ වෙනත් සම්පත් පිළිබඳ වාර්තා සහ එම කාලය තුළ දී සංගමය විසින් ඉටු කරන ලද කාර්යය පිළිබඳ මාස හයක ප්‍රගති වාර්තාවක් සෑම වර්ෂයක්ම ආරම්භ වී මාස හයක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. මෙම වාර්තා සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා ජාතික ක්‍රීඩා සභාව වෙත භාරදෙනු ලැබිය යුතු ය.

42. තමාගේ ධූරය දැරීම අවසන්වන යම් ජාතික සංගමයක සෑම නිලධරයකුම හෝ කමිටු සාමාජිකයකුම විසින් එසේ තමාගේ ධූරය දැරීම අවසන්වන දින සිට දින දාහතරක කාලයක් ඇතුළත තමාගේ සන්තකයේ පවතින ජාතික සංගමයට අයත් දේපළ වෙනත් යම් නිලධරයකු හෝ කමිටු සාමාජිකයකු හෝ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

43. සෑම ජාතික සංගමයක් විසින්ම මෙහි I වැනි උපලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූල ලෙස එහි අනුබද්ධිත ආයතනවල රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

44. නීතිය ප්‍රකාරව පවත්වනු ලබන විනය පරීක්ෂණයකින් පසුව ජාතික සංගමයක යම් අනුබද්ධිත ආයතනයක සාමාජිකත්වය අවලංගු කිරීම සඳහා සෑම ජාතික සංගමයකටම බලය ඇත්තේ ය.

45. අමාත්‍යාංශය විසින් අවශ්‍ය බවට නියම කරනු ලැබිය හැකි යම් ජාතික සංගමයක පුහුණුකරුවන්, තරග තීරකවරුන්, විනිසුරුවන් සහ වෙනත් නිලධරයන් සෑම ජාතික සංගමයක් විසින්ම ලියාපදිංචිකර, බඳවාගෙන පුහුණුකරනු ලැබිය යුතු ය. එම පුහුණුකරුවන්, තරගතීරකවරුන්, විනිසුරුවරුන් සහ වෙනත් නිලධරයන් පත් කිරීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි විභාග ඇතුලුව යම් නිර්ණායකවල පදනම මත සහ ජාත්‍යන්තර පාලක මණ්ඩලයේ මාර්ගෝපදේශවලට යටත්ව සිදු කළ යුතු ය.

46. සෑම ජාතික සංගමයකම බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ සිදු කිරීම සම්බන්ධයෙන් ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සියලු තොරතුරු එම සෑම ජාතික සංගමයක්ම විසින් ලේකම්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

47. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට එම සංගමය විසින් පවත්වනු ලබන තරගවලට සහභාගී වන්නා වූ තැනැත්තන්ට අදාළ සියලු විස්තර සෑම ජාතික සංගමයක් විසින්ම ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

48. ජාතික කණ්ඩායම් සඳහා ක්‍රීඩකයන් තෝරා ගැනීමේ දී අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධාන සෑම ජාතික සංගමයක් විසින්ම අනුගමනය කරනු ලැබිය යුතු ය.

49. සෑම ජාතික සංගමයකම තේරීම්, කුසලතා සහ ශ්‍රේණිගත කිරීමේ කමිටු සෑම වර්ෂයකම ආරම්භයේ දී එම ජාතික සංගමය වෙත සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පසුගිය වර්ෂයේ දී ශ්‍රේණිගත කිරීමේ ක්‍රීඩා තරගාවලියට සහභාගී වී ඇති එක් එක් ක්‍රීඩකයා පිළිබඳව කුසලතා වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

50. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ක්‍රීඩා සංචිත සහ ජාතික සංගම්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කර ජාතික කණ්ඩායම් තෝරා ගැනීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

51. ජාත්‍යන්තර ක්‍රීඩා තරගවල දී ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලබන සෑම ක්‍රීඩකයකුම විසින් අනුමත ජාතික ලාංඡන හෝ ජාතික ගෞරව ලාංඡන පළඳිනු ලබන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සහතික විය යුතු ය.

52. සෑම ජාතික සංගමයක් විසින්ම සෑම මට්ටමකින්ම තමා විසින් නියෝජනය කරනු ලබන ක්‍රීඩාව ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම කරනු ලැබිය යුතු අතර එම ක්‍රීඩාව සඳහා ක්‍රීඩකයන් සහභාගිවීම වැඩිකිරීමේ අරමුණින් එම ක්‍රීඩාව සඳහා පහසුකම් වැඩි දියුණු කරනු ලැබිය යුතු ය.

53. විදේශයන්හි දී ජාතික සංගම් නියෝජනය කරනු ලබන ජාතික කණ්ඩායම්වල කළමනාකරුවන් සහ නියෝජිතයන් විසින් අදාළ ජාතික සංගමයේ ලේකම්වරයා මගින් එම කණ්ඩායම හෝ නියෝජිතයා ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමේ දින සිට දින දාහතරක කාලයක් ඇතුළත යම් විදේශ ක්‍රීඩා තරග සංචාර පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

54. (1) යම් තැනැත්තකු, ආයතනයක්, ක්‍රීඩා සමාජයක්, සංවිධානයක් හෝ අනුබද්ධිත ආයතනයක් විසින් ස්වකීය ජාතික සංගමයේ තීරණයකින් අතෘප්තියට පත්වන අවස්ථාවක දී, එම තැනැත්තා, ආයතනය, ක්‍රීඩා සමාජය, සංවිධානය හෝ අනුබද්ධිත ආයතනය විසින් තමා වෙත එකී තීරණය ලැබීමේ දින සිට දින දාහතරක කාල සීමාවක් ඇතුළත එම තීරණයට එරෙහිව අමාත්‍යවරයා වෙත ලිඛිත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) එම අභියාචනය පිළිබඳ අමාත්‍යවරයාගේ නියමය එම ජාතික සංගමය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

55. (1) පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කරන ලද අතුරු වැඩ පිළිවෙලක් මත ස්වකීය සංගමය අත්හිටුවීමට යටත්ව සිටින්නා වූ හෝ ස්වකීය ලියාපදිංචිය ප්‍රතික්ෂේපකර හෝ අවලංගුකර ඇත්තා වූ යම් ජාතික ක්‍රීඩා සංගමයක කර්තව්‍ය අඛණ්ඩව සිදු කිරීමට පැවරී ඇත්තා වූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් එම ජාතික සංගමයේ භාරකරුවන් වශයෙන් එම ජාතික සංගමයට අයත් හෝ එම ජාතික සංගමයේ නීත්‍යානුකූල සන්තකයේ පවතින සියලු නිශ්චල සහ චංචල දේපළ කළමනාකරණය කරනු ලැබිය යුතු අතර එම ජාතික ක්‍රීඩා සංගමයේ නිලධරයන් විසින් එම නිශ්චල හා චංචල දේපළ කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය. මේ සම්බන්ධයෙන් එම ජාතික සංගමය විසින් අයිතිය දරනු ලබන හෝ නීත්‍යානුකූලව සන්තකය දරනු ලබන එම චංචල හෝ නිශ්චල දේපල ලබා ගැනීම හෝ භාරදීම, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිටපතක් ද සමග නිසි පරිදි ලේඛනගතකර වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) එම ජාතික සංගමයේ කර්තව්‍ය නිසි උද්යෝගයෙන් යුතුව අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ තමා වෙත පවරා ඇති දේපළ නිසි උද්යෝගයෙන් කළමනාකරණය සහ පාලනය කිරීම එසේ එම කාර්යයන් පවරා ඇති තැනැත්තන්ගේ වගකීම් වන්නේ ය.

(3) අත්හිටුවා ඇති හෝ ස්වකීය ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර හෝ අවලංගුකර ඇති යම් ජාතික ක්‍රීඩා සංගමයක කර්තව්‍ය ඉටුකිරීම සඳහා පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව යම් අතුරු වැඩපිළිවෙලක් යටතේ පත්කර ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් වෙනත් කරුණු අතර කොන්ත්‍රාත්වලට, ගිවිසුම්වලට ඇතුළත් වීමේ අයිතිය, බැංකු ගිණුම් පවත්වාගෙන යාමේ අයිතිය ඇතුලුව එම ලියාපදිංචිය අත්හිටුවා, අවලංගුකර හෝ ප්‍රතික්ෂේපකර ඇති ජාතික සංගමයක් විසින් භුක්ති විඳිනු ලබන සියලු බලතල, අයිතිවාසිකම් සහ වරප්‍රසාද භුක්ති විඳිනු ලැබිය යුතු අතර එම ලියාපදිංචිය අත්හිටුවනු ලැබ, අවලංගුකර හෝ ප්‍රතික්ෂේප කර ඇති ජාතික ක්‍රීඩා සංගමයේ සියලු කර්තව්‍ය අඛණ්ඩව පවත්වාගෙන යෑමට සහ එම ජාතික ක්‍රීඩා සංගමයේ කර්තව්‍ය අඛණ්ඩව පවත්වාගෙන යෑමට අවශ්‍ය බවට පෙනීයන අලුත් වැඩපිළිවෙලක් හෝ ව්‍යාපෘති සඳහා ඇතුළත් වීමට එම තැනැත්තාට හෝ තැනැත්තන්ට සම්පූර්ණයෙන්ම බලය පවරා ඇත.

(4) පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව සාදන ලද අතුරු වැඩපිළිවෙලක කාලසීමාව අවසන් වීමෙන් පසුව, වෙනත් කරුණු අතර ලියාපදිංචිය අත්හිටුවා, අවලංගුකර හෝ ප්‍රතික්ෂේපකර ඇති යම් ජාතික ක්‍රීඩා සංගමයක කර්තව්‍ය අඛණ්ඩව පවත්වාගෙන යෑම

සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඇතුළත්වන හෝ ගනු ලබන කොන්ත්‍රාත්, ගිවිසුම් සහ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඒවාට ගරු කිරීම සඳහා ජාතික ක්‍රීඩා සංගමයක නිලධරයන් බැඳී සිටිය යුතු අතර ඒ සඳහා නීත්‍යානුකූලව ඔවුන් වෙත බලය පැවරෙන්නේ ය.

56. 1975 මාර්තු මස 02 දින අංක 155/66 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, 1976 මාර්තු මස 08 වැනි දින අංක 203/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1977 පෙබරවාරි මස 17 වැනි දින අංක 252/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, 1977 අප්‍රේල් මස 07 වැනි දින අංක 259/8 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද. 1981 නොවැම්බර් මස 19 වැනි දින අංක 167/6 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1988 මාර්තු මස 08 වැනි දින අංක 496/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2002 පෙබරවාරි මස 07 වැනි දින අංක 1222/16, 2002 පෙබරවාරි මස 25 වැනි දින අංක 1225/7, 2003 අප්‍රේල් මස 23 වැනි දින අංක 1285/12, 2005 මැයි මස 21 වැනි දින අංක 1389/24 සහ 2008 ජූලි මස 16 වැනි දින අංක 1558/11 දරන *අති විශේෂ ගැසට් පත්‍රවල* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 1974 මැයි මස 07 වැනි දින අංක 110/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1973 අංක 02 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

57. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ නියෝගවල ඃ

"පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත අදහස් වේ.

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පත්කරන ලද ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"ප්‍රධාන ක්‍රීඩා තරගාවලිය", "ක්‍රීඩා උත්සවය" හෝ "තරගය" යන්නෙන්, තත්කාර්යය සඳහා ජාතික සංගමයක් විසින් කරනු ලබන නිර්දේශ මත අමාත්‍යවරයා විසින් කලින් කල අනුමත කරනු ලබන යම් ක්‍රීඩා තරගාවලියක්, ක්‍රීඩා උත්සවයක් හෝ තරගයක් අදහස් වේ.

"චංචල දේපල" යන්නෙන්, යම් රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, ඍණපත්‍ර හෝ වෙනත් ආයෝජන වශයෙන් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක සංගමය වෙනුවෙන් පවතින හෝ සංගමයේ බැරට දරනු ලබන සියලු මුදල් අදහස් වේ.

**පළමුවැනි උපලේඛනය**

(*3 වැනි නියෝගය*)

***"අ" ආකෘතිය***

*ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම*

1. ජාතික ක්‍රීඩා සංගමයේ නම :..........................................................................................................

2. ලිපිනය :..........................................................................................................................

3. :..........................................................................................................ක්‍රීඩාව සංවර්ධනය කිරීමෙහිලා යෙදී සිටින :........................................................................................සහ ක්‍රීඩා සංගමයේ (ක්‍රීඩා සංගමයේ නම) සාමාජිකයන්ගෙන් යුක්ත වූ ..............................දින නාමයෝජනා කරන ලද ක්‍රීඩා සංගමයකි.

4. පහත දැක්වෙන ලේඛන මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා ඇත :.......................................................................

5. ඉහත සඳහන් වර්තමාන නිලධාරීන් සහ කාරක සභිකයන් තෝරාපත් කර ගනු ලැබූ වාර්ෂික මහ සභා රැස්වීම පවත්වනු ලැබූ දිනය :..........................................................................................................

ලියාපදිංචිය සඳහා ඉල්ලීම යථාපරිදි භාරදීම සඳහා බලය පවරමින් ..........................................................යන ජාතික සංගමයේ (ජාතික සංගමයේ නම) මහ සභා රැස්වීමේ දී සම්මත කරන ලද යෝජනා සම්මතයට පසුව ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.

ජාතික ක්‍රීඩා සංගමයේ සභාපතිගේ අත්සන :

නම සහ ලිපිනය :

දිනය :

ලේකම්ගේ අත්සන :

නම සහ ලිපිනය :

ඉල්ලුම්කරුගේ අත්සන :

**"ආ" ආකෘතිය**

*(4 වැනි නියෝගය)*

*ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ සහතික පත්‍රය*

ජාතික ක්‍රීඩා සංගමයේ නම :...................................................................................................

...................................................................................................යන ක්‍රීඩාව සඳහා වූ ජාතික ක්‍රීඩා

සංගමය වශයෙන් 20 ........................මස ........................දින සිට බලපැවැත්වෙන පරිදි ...........................යන

ජාතික ක්‍රීඩා සංගමය 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි කරන ලද බවට මෙයින් සහතික කරනු ලැබේ.

සංගමයට පවරා ඇති ලියාපදිංචි අංකය ..................................................... වේ.

ක්‍රීඩා අමාත්‍යවරයා.

දිනය :

"ඇ" ආකෘතිය

*(6 වැනි නියෝගය)*

"අ" කොටස

*ජාතික ක්‍රීඩා සංගම්වලට කෙළින්ම අනුබද්ධ සාමාජිකයන්ගේ ලේඛනය*

1. ජාතික ක්‍රීඩා සංගමයේ නම :..........................................................................................................
2. අනුබද්ධ ආයතනයේ නම :..........................................................................................................
3. ලිපිනය :..........................................................................................................
4. සාමාජික සංඛ්‍යාව :..........................................................................................................
5. වාර්ෂික මහා සභා රැස්වීම්වලට පැමිණීමට ඉඩ දෙනු ලැබූ නියෝජිත සංඛ්‍යාව :.......................................
6. වාර්ෂික මහා සභා රැස්වීම්වල දී සාමාජිකයන්ට හිමි ඡන්ද සංඛ්‍යාව :.......................................
7. සාමාජිකයන්ගේ නම් :..........................................................................................................
8. ධූර නාම සහිතව නිලධාරීන්ගේ නම් සහ ලිපිනයන් :..........................................................
9. කාරක සභිකයන්ගේ නම් සහ ලිපිනයන් :..........................................................

"ආ' කොටස

*ජාතික ක්‍රීඩා සංගම්වලට අනුබද්ධ වී ඇති පළාත් සංගම්වලට, දිස්ත්‍රික් සංගම්වලට, සම්මේලනවලට, ලීගයන්ට හෝ වෙනත් සංවිධානවලට අනුබද්ධ සාමාජිකයන්ගේ නාම ලේඛනය*

1. පළාත් සංගමයේ, දිස්ත්‍රික් සංගමයේ, සම්මේලනයේ, ලීගයේ හෝ වෙනත් සංවිධානයේ නම :.....................
2. ලිපිනය :..........................................................................................................
3. අනුබද්ධ ආයතනයේ නම :..........................................................................................................
4. ලිපිනය :..........................................................................................................
5. සාමාජික සංඛ්‍යාව :..........................................................................................................
6. ධූර නාම සහිතව නිලධාරීන්ගේ නම් සහ ලිපිනයන් :..........................................................
7. කාරක සභිකයන්ගේ නම් සහ ලිපිනයන්:..........................................................

දෙවැනි උපලේඛනය

1. බැඩ්මින්ටන්
2. ජල ක්‍රීඩා
3. කාය වර්ධන
4. පාපැදි
5. රයිෆල්
6. හොකී
7. කරාතේ දෝ
8. රුවල් ඔරු
9. රග්බි පාපන්දු
10. බර ඉසිලීම
11. ජිම්නාස්ටික්
12. ගොල්ෆ්
13. මල්ලවපොර
14. මෝටර් රථ ක්‍රීඩා
15. පැසිපන්දු
16. මලල ක්‍රීඩා
17. ක්‍රිකට්
18. දැල් පන්දු
19. ටෙනිස්
20. බ්‍රිජ්
21. කැරම්
22. ජීවිතාරක්ෂක
23. බොක්ෂිං
24. ජූඩෝ
25. බිලියඩ් හා ස්නූකර්
26. පාපන්දු
27. වොලිබෝල්
28. එල්ලේ
29. චෙස්
30. ඔරු පැදීම
31. මේස පන්දු
32. ස්කොෂ්
33. ටයිකොන්ඩෝ
34. සැහැල්ලු පන්දු ක්‍රිකට්
35. සවි එසවීම
36. කබඩි
37. ආබාධිතයන්ගේ ක්‍රීඩා
38. මෝටර් සයිකල් ක්‍රීඩා
39. බේස්බෝල්
40. වුෂු
41. ත්‍රෝ බෝල්
42. දුනු විදීම
43. තුරඟ ක්‍රීඩා
44. සම්ප්‍රදායික කරාතේ
45. අත් පන්දු
46. කඹ ඇදීම
47. වෙඩි තැබීම
48. කඩු හරඹ

02-14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.